# Path to Success – Study Pack

## පළමු පාසල් වාරය සඳහා ඉගෙනුම් අත්වැල

## භූගෝල විද්‍යාව - 9 ශ්‍රේණිය



අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය

**උපදේශනය හා අධීක්ෂණය**

පී.ඩී.ඉරෝෂිනී කේ. පරණගම මිය

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

**මෙහෙයවීම හා සංවිධානය**

එෆ්.එච්.ජේ. පී. සිල්වා මයා

නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ( අධ්‍යාපන සංවර්ධන )

**විෂය සම්බන්ධීකරණය**


කේ.එල් නිල්මිණී පෙරේරා මෙය - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සමාජ විද්‍යා )

**සම්පත් දායකත්වය**

- සෝමා දීගල්ල මිය - ගුරු උපදේශක (සමාජ විද්‍යා - කැලණිය කොට්ඨාසය)
- ජී.නිරෝෂා මල්කාන්ති මෙය - බප/ කැල ශ්‍රී සුමංගල ම.වි.

සියලු හිමිකම් ඇවිරිණි

# 1 පාඩම - ආසියානු ප්‍රදේශය




ආසියානු මහාද්වීපයේ පිහිටීම දැක්විය හැකි ආකාර දෙකකි.

1. සාපේක්ෂ පිහිටීම

සාපේක්ෂ පිහිටීම යනු දිශාවන් සම්බන්ධ කරගෙන පිහිටීම ප්‍රකාශ කිරීමයි. ඒ අනුව ආසියානු මහාද්වීපයේ සාපේක්ෂ පිහිටීම පහත දැක්වෙන පරිදි වේ.

- උතුරින් - ආක්ටික් සාගරය
- නැගෙනහිරින් - පැසිෆික් සාගරය
- දකුණෙන් - ඉන්දියන් සාගරය
- බටහිරින් - යුරෝපා මහාද්වීපය

2. නිරපේක්ෂ පිහිටීම


නිරපේක්ෂ පිහිටීම යනු පෘථිවි ගෝලයේ අක්ෂාංශ හා දේශාංශ අනුව පිහිටීම ප්‍රකාශ කිරීමයි.

ආසියා මහාද්වීපය දකුණු අක්ෂාංශ $10^0$ සිට උතුරු අක්ෂාංශ $80^0$ අතර සහ නැගෙනහිර දේශාංශ $25^0$ සිට $180^0$ අතර පිහිටා ඇත.

අභ්‍යාසය

* **සිතියම් පොතක් භාවිතා කරගෙන පහත දැක්වෙන දේ හඳුනාගෙන දී ඇති සිතියමෙහි ලකුණු කර නම්කරන්න.**

යූරල් කඳුවැටිය, යූරල් ගඟ, කැස්පියන් මුහුද, කොකේසස් කඳු, කළු මුහුද, මධ්‍යධරණී මුහුද, සූවස් ඇළ, රතු මුහුද



<u>**ආසියානු ප්‍රදේශයේ සුවිශේෂත්වය**</u>

ආසියානු ප්‍රදේශය සුවිශේෂ ප්‍රදේශයක් වීමට බලපෑ හේතු කිහිපයකි.


භෞතික හා මානුෂ වශයෙන් සුවිශේෂී වූ ලක්ෂණ කිහිපයක්

- විශාලතම මහාද්වීපය වීම
- සියලු ම දේශගුණ වර්ග දක්නට ලැබීම
- මානව වර්ග, ජන වර්ග, භාෂා හා සංස්කෘතික විවිධත්වය
- ප්‍රධාන ආගම් රැසක නිජබිම වීම
- ලෝකයේ විශාලතම කඳු පද්ධතිය සහ වඩාත් උස ම කඳු ශිඛරය පිහිටා තිබීම
- වැඩි ම ජන සංඛ්‍යාවක් වාසය කිරීම

- ලෝකයේ විශාලතම කඳුපංතිය පිහිටා තිබීම
- ලොව වැඩිම වර්ෂාපතනය ලැබෙන ස්ථානය පිහිටා තිබීම

- ඉහළ ජෛව විවිධත්වයක් තිබීම
- ලෝකයේ වැඩිම ජනසංඛ්‍යාවක් වාසය කරන කලාපය වීම
- ජන වර්ග හා සංස්කෘතීන් විශාල සංඛ්‍යාවක් තිබීම
- පැරණි ශිෂ්ටාචාර බිහිවූ ප්‍රදේශය වීම
- ලොව ප්‍රධාන ආගම් බිහිවූ ප්‍රදේශය වීම

## <u>ආසියාවේ භූ විෂමතාවය</u>




- ආසියාවේ කැපී පෙනෙන භූ විෂමතා ලක්ෂණය වන්නේ හිමාලය කඳු වැටියයි. එහි දිග කිලෝමීටර් 2500 ක් වන අතර වර්ග කිලෝ මීටර් 6,12,000 ක භූමි ප්‍රදේශයක පැතිර පවතී.
- මේ විශාල කඳුවැටිය නිසා ආසියාවෙන් ඉන්දියාව වෙන් වී පෙනෙන නිසා එය ඉන්දීය උප මහාද්වීපය ලෙසද හැඳින්වේ.

## <u>ආසියාවේ භූ විෂමතා ලක්ෂණ</u>

**කඳු**
- එවරස්ට්, කන්චන්ජුංගා, මකාලු, ධවල ගිරි, මනස්ලු, අන්නපූර්ණා, නන්දා දේවි
- අල්තායි, තුන්ලුන්, කාරකෝරම්, ටියෙන්ෂාන්, සාටස්, සාග්‍රොස්, යූරල්

**සානු**
- ටිබෙට් සානුව, පාමීර් සානුව, ඩෙකෑන් සානුව, මධ්‍යම සයිබීරියානු සානුව, ඉරාන සානුව

**තැනිතලා**
- බටහිර සයිබීරියානු තැන්න, මැන්චූරියානු තැන්න, චීන මහා තැන්න, සින්දු ගංගා තැන්න

**ගංගා**
- ඕබි, යෙනිසි, ලීනා, අමූර්,හොවැංහෝ, යැංසි, ගංගා, ඉන්දු, බ්‍රහ්මපුත්‍රා, මීකොං, ඉරවඩි, සැල්වීන්, යුප්‍රටීස්, ටයිග්‍රීස්, යූරල්, සර්ඩේරියා, අමුඩේරියා


**විල්**
- බයිකල්, බොල්කෑෂ්

## <u>ආසියාවේ දේශගුණය</u>

**කාලගුණය යනු, කිසියම් ප්‍රදේශයක පවතින උෂ්ණත්වය, ආර්ද්‍රතාව, වායුගෝලීය පීඩනය, සුළඟ ආදියෙහි කෙටි කාලීන වෙනස්වීමයි. දේශගුණය යනු, එම කෙටිකාලීන කාලගුණික තත්ත්වයන් දිගු කාලීනව පැවතීමයි.**

**සමකයේ සිට උත්තර ධ්‍රැවය සහ දක්ෂිණ ධ්‍රැවය දක්වා උෂ්ණත්ව ව්‍යාප්තියේ පවතින වෙනස්කම් අනුව පෘථිවිය ප්‍රධාන දේශගුණික කලාප තුනකට බෙදා දැක්වේ.**

- **නිවර්තන කලාපය (උණුසුම් දේශගුණ)**
- **සෞම්‍ය කලාපය (සෞම්‍ය දේශගුණ)**
- **ශීත කලාපය (ශීත දේශගුණ)**



ආසියා මහාද්වීපය සමකයේ සිට උත්තර ධ්‍රැවය දක්වා ම පැතිරී තිබෙන බැවින් මෙම දේශගණික කලාප තුනට ම අයත් ප්‍රදේශ දක්නට ලැබේ.

නිවර්තන කලාපය (උණුසුම් දේශගුණ)

- අවුරුද්ද මුළුල්ලේ ම ඉතා ඉහළ උෂ්ණත්වයක් පවතී
- සාමාන්‍ය උෂ්ණත්වය $18^{O}C$ වැඩි ය
- මේ නිසා උෂ්ණ දේශගුණ තත්ත්වයන් දක්නට ඇත

සෞම්‍ය කලාපය (සෞම්‍ය දේශගුණ)

- නිවර්තන කලාපයට වඩා සාමාන්‍ය උෂ්ණත්වය අඩු ය
- වර්ෂය පුරා කාලයෙන් කාලයට උෂ්ණත්වය අඩු වැඩි වීම නිසා සෘතු භේදය පවතී එනම් පැහැදිලි උණුසුම් සෘතුවක් සහ ශීත සෘතුවක් මෙම කලාපයේ දක්නට ලැබේ

ශීත කලාපය (ශීත දේශගුණ)

- උෂ්ණත්වය ඉතා පහළ මට්ටමක පැවතීම නිසා වසරේ වැඩි කාලයක් තුළ හිම පතනය සහ හිමෙන් වැසී තිබේ
- මෙම දේශගුණ කලාප තුන තුළ පහත සාධකවල බලපෑම නිසා එකිනෙකට වෙනස් ලක්ෂණවලින් යුතු උපදේශගුණ වර්ග ගණනාවක් දක්නට ඇත.

  * වර්ෂාපතනයේ වෙනස්කම්
  * මෝසම් සුළං බලපෑම
  * සාගරික බලපෑම
  * මහාද්වීපික පිහිටීම
  * කඳු පද්ධතිවල පිහිටීම
  * මුහුදු මට්ටමේ සිට උස

ඉතාමත් අන්තගාමී දේශගුණ තත්වයන් පවතින ස්ථාන ද ආසියාවේ පැවතීම විශේෂත්වයකි.

ආසියාවේ ඉතා අඩු ම උෂ්ණත්වයක් වාර්තා වන වර්කොයෑන්ස්ක් (Verkhoyansk) රුසියාවේ පිහිටි කුඩා නගරයක් වන අතර එහි උෂ්ණත්වය ඇතැම් දිනවල $-50^{o}C$ පමණ දක්වා අඩු වන බව වාර්තා වේ.

ආසියාවේ ඉහළ ම උෂ්ණත්වයක් වාර්තා වන්නේ පාකිස්ථානයේ ජකෝබාබාද් නගරයෙන් (Jacobabad) වන අතර එය $55\,^{o}C$ පමණ වෙයි.

ආසියාවේ දේශගුණ වර්ග පහත වගුවේ දක්වා ඇත.

| දේශගුණික කලාපය | දේශගුණ වර්ග | පැතිරී පවතින රටවල්/ ප්‍රදේශ |
|---|---|---|
| නිවර්තන | නිවර්තන වර්ෂා දේශගුණය | ජාවා, සුමාත්‍රා දූපත් |
| | නිවර්තන මෝසම් දේශගුණය | ඉන්දියාව, ශ්‍රී ලංකාව, මියැන්මාර් |
| | නිවර්තන සැවනා දේශගුණය | උතුරු ඉන්දියාවේ ඊසානදිග කොටස, බංග්ලාදේශය |
| | උෂ්ණ කාන්තාර දේශගුණය | ඉන්දියාව, තාර් කාන්තාරය මැදපෙරදිග රටවල් |
| සෞම්‍ය | උණුසුම් සෞම්‍ය දේශගුණය | මධ්‍යධරණී මුහුදු අවට ප්‍රදේශ |
| | තෙත් සෞම්‍ය දේශගුණය | නැගෙනහිර චීනය, ජපන් දූපත් |
| ශීත | ධ්‍රැව සහ තුන්ද්‍රා දේශගුණය | සයිබීරියානු කලාපය සහ ආසියාවේ උතුරු කොටස් |
| | කඳුකර දේශගුණය | හිමාලය කඳු ආශ්‍රිත ප්‍රදේශ |

# වෘක්ෂලතා හා වන ජීවීන්

- ❖ වර්ෂාපතනයේ වෙනස්කම් සහ උෂ්ණත්ව වෙනස්කම් අනුව ස්වාභාවික වෘක්ෂලතා ද ප්‍රාදේශීය වශයෙන් වෙනස් වේ.
- ❖ ඒ අනුව එක් එක් දේශගුණ වර්ගයන්ට අනුව ස්වාභාවික වෘක්ෂලතා සහ වන ජීවීන් ද හැඩගැසී ඇත.

**නිවර්තන කලාපය - නිවර්තන වර්ෂා වනාන්තර**

- ඉහළ උෂ්ණත්වයක් පවතින සහ වසර පුරා අධික වර්ෂාපතනයක් ලැබෙන ප්‍රදේශවල නිවර්තන සදාහරිත වර්ෂා වනාන්තර දක්නට ඇත.
- මෙම වනාන්තරවල මැහෝගනි, එබොනි, රෝස්වුඩ්, කළුවර, උණ වර්ග, හඳුන්, ඇකේෂියා වැනි උසින් වැඩි විවිධ ශාක වර්ග දක්නට ඇත.
- ඒවායේ ශාක, ස්ථර කිහිපයකින් යුක්ත ය. එය ස්ථරායනය යනුවෙන් හැඳින්වේ.
- වැල් වර්ග, පෙඳ හා පාසි වර්ග මෙන් ම අපිශාක වර්ග ද එහි බහුල යණ
- ශාක වේගයෙන් වර්ධනය වන අතර ජෛව විවිධත්වය අධික ය.
- මෙම නිවර්තන සදාහරිත වර්ෂා වනාන්තරවල
  - වඳුරු විශේෂ
  - උරග වර්ග
  - සර්ප විශේෂ
  - මත්ස්‍ය විශේෂ
  - කටුසු විශේෂ මෙන් ම
  - කොටියා, දිවියා, වලසා, ඌරා, නරියා, මුවා, ගෝනා වැනි සිවුපා විශේෂ ද බහුල ය

## සෞම්‍ය කලාපය - පතනශිල වනාන්තර

- වසරේ උණුසුම් ගිම්හාන සෘතුවක් පැවතිමත් ශිත සෘතුවක් පැවතිමත් යන දේශගුණ තත්වයන්ට අනුරූප වූ සෞම්‍ය කලාපයේ පතනශිල වනාන්තර දක්නට ලැබේ.
- වාර්ෂික ව පත්‍ර හැලිම මෙම වනාන්තරවල විශේෂ ලක්ෂණය වේ.
- ඕක්, මල්බෙරි, චෙස්නට්, පයින්, යුකැලිප්ටස්, ඩග්ලස්ෆර් මෙම වනාන්තරවල විශේෂිත ශාක වර්ගයන් ය.
- වෘකයා, වලසා, ගෝනා, මුවා, ඇන්ටිලොප් වැනි වන ජිවීන් මෙහි දක්නට ඇත.

## ශිත කලාපය - කේතුධර වනාන්තර

ටයිගා හා තුන්ද්‍රා දේශගුණ සහිත මෙම කලාපයේ දිගු ශිත සෘතුවක් පැවතිම විශේෂ ලක්ෂණය වේ.

**ටයිගා** ඉහළ අක්ෂාංශ වල සහ උස් කඳුකර බෑවුම් වල දැක ගත හැකිය. උත්තර අර්ධ ගෝලයේ බහුල වශයෙන් පැතිර පවතී. දේශගුණික ලක්ෂණ ලෙස ගිම්හානය කෙටි වන අතර ශිශිරය දිගු වේ. ගිම්හානයේදී උෂ්ණත්වය අධික නොවේ. ශිශිරයේදී හිම පතනය වේ. එම නිසා පස වියළිව මිදුණු ස්වභාවයක් ගනී.

**තුන්ද්‍රා** ආක්ටික් මුහුදු සීමා වල බහුලව දැක ගත හැකිය. කැපී පෙනෙන ලක්ෂණය වනුගේ ශීත සෘතුව මුළුමනින්ම අඳුරු වීමයි. සූර්ය තාපනය දුබල වේ. උණුසුම් සෘතුවේදී හිම පතනය වේ. ගමම ප්‍රදේශ වල ප්‍රබල හිම කුණාටු ඇති වේ.

- කේතුධර වනාන්තර මෙම කලාපයේ පිහිටා ඇත.
- හිම පතනයට ඔරොත්තු දෙන සේ සකස් වූ මේ කේතුධර වනාන්තරවල ශාක කේතු රූපාකාර හැඩයෙන් යුක්ත ය.
- ශාක පත්‍ර ඉඳිකටු තුඩු වැනි හැඩ සහිත ය.
- පයින් වර්ග, ස්පෘස්, ෆර්, ඕක්, ලාච් වැනි ශාක විශේෂ මෙහි දක්නට ඇත.
- පිනිමුවා, හිම වලසා, හිම නරියා, හිම බල්ලා, සේබල්, මින්ක් වැනි සත්ව විශේෂ ද දක්නට ලැබේ.

## ක්‍රියාකාරකම්

1. ආසියා මහාද්වීපයේ දක්නට ලැබෙන ප්‍රධාන දේශගුණ කලාප තුන සහ එම එක් එක් කලාපයේ දක්නට ඇති දේශගුණ වර්ග වගුගත කරන්න.

2. එම එක් එක් දේශගුණ කලාපවල ව්‍යාප්ත ස්වාභාවික වෘක්ෂලතා ප්‍රභේද මොනවා දැයි සඳහන් කරන්න.

3. ඉහත සඳහන් කළ එක් එක් ස්වාභාවික වෘක්ෂලතා ප්‍රභේදය තුළ වැඩෙන වෘක්ෂලතා විශේෂ සහ සත්ව විශේෂ නම් කරන්න.

## ආසියාවේ මානුෂ භූදර්ශනය

### පැරණි මානව ශිෂ්ටාචාර

- මානව ඉතිහාසය පිළිබඳ ව දැනට සොයාගෙන ඇති තොරතුරු අනුව ලෝකයේ ගංගා නිම්න ආශ්‍රිත ව ඉපැරණි ශිෂ්ටාචාර කිහිපයක් බිහි වී ඇත.

- යුප්‍රටීස් ටයිග්‍රිස් නිම්නය, ඉන්දු නිම්නය, හොවැංහෝ නිම්නය සහ නයිල් නිම්නය ඉන් ප්‍රධාන වේ.




❖ ඉන්දු ගංගාව වර්තමාන පාකිස්ථානයට හා ඉන්දියාවට අයත් ප්‍රදේශ හරහා ගලා බැස කරච්චි නගරය අසලින් අරාබි මුහුදට වැටේ. මෙම ගංගා නිම්නය ආශ්‍රිත ව මොහෙන්ජොදාරෝ සහ හරප්පා යන ඉපැරණි නගර දෙක මුල් කරගත් දියුණු නාගරික ශිෂ්ටාචාරයක් වන ඉන්දු නිම්න ශිෂ්ටාචාරය බිහි විය.

❖ චීනය හරහා ගලා බසින කහ ගඟ හෙවත් හොවැංහෝ ගංගා නිම්නයේ අන්යාන් නගරය මුල් කොට ගත් දියුණු නාගරික ශිෂ්ටාචාරයක් වන හොවැංහෝ නදී නිම්න ශිෂ්ටාචාරය බිහි විය.

❖ වර්තමාන ඉරාකය හරහා ගලා බසින යුප්‍රටීස් සහ ටයිග්‍රිස් දෙගංමැදි ප්‍රදේශයේ වර්ධනය වී තිබූ බවට සාක්ෂ්‍ය තිබෙන ශිෂ්ටාචාරය වන්නන් මෙසොපොටේමියානු ශිෂ්ටාචාරය යි.


❖ ක්‍රමවත් නගර නිර්මාණය, ගොඩනැගිලි හා ප්‍රතිමා නිර්මාණය, කෘෂිකර්මය, කලාත්මක භාණ්ඩ නිෂ්පාදනය මෙම ශිෂ්ටාචාරවල දියුණු වී පැවති විශේෂ ලක්ෂණ වේ.

# <u>මානව වර්ග</u>

❖ විවිධ දේශගුණ තත්වයන්ට විශේෂ වූ මානව වර්ග ද ජන වර්ග රැසක් ද ආසියානු ප්‍රදේශයේ වාසය කරනු දක්නට ලැබේ.

- කොකසොයිඩ්
- මොංගලොයිඩ්
- නිග්‍රොයිඩ්

ප්‍රධාන වශයෙන් ආසියානු කලාපයේ ජිවත් වන මානව වර්ග දෙකක් දක්නට ලැබේ.




# <u>ජන ව්‍යාප්තිය</u>

* ආසියාවේ වර්තමාන ජන සංඛ්‍යාව මිලියන 4460ක් පමණ වේග ද ඉන් අඩකටත් වැඩි ප්‍රමාණයක් සිටිනුයේ චීනය සහ ඉන්දියාව යන රටවල් දෙකෙහි ය.

* මෙම ජන සංඛ්‍යාව කලාපිය වශයෙන් මෙන් ම රටවල් අතර ද අසමාන ව ව්‍යාප්ත ව ඇත.

* මෙම අසමාන ජන ව්‍යාප්තිය කෙරෙහි ප්‍රධාන වශයෙන් ම භෞතික සාධක බලපා තිබේ. ශ්‍රී භූ විෂමතාව ශ්‍රී දේශගුණය ශ්‍රී ජලවහනය ශ්‍රී පස එවැනි භෞතික සාධක කිහිපයකි.

වර්ග කිලෝ මීටරයට 500ට වැඩි අධික ජන ඝනත්වයක් දක්නට ලැබෙන කලාප ලෙස

- දකුණු ආසියාව
- අග්නිදිග ආසියාව
- නැගෙනහිර ආසියාවේ ගංගා නිම්න ආශ්‍රිත ප්‍රදේශ හඳුනා ගත හැකිය.

උදාහරණ උතුරු ඉන්දියාවේ ඉන්දු ගංගා තැන්න ආශ්‍රිත කලාපය


මියන්මාරයේ ඉරවඩි ගංගා නිම්නය ආශ්‍රිත කලාපය

චීනයේ හොවැංහෝ නිම්න ආශ්‍රිත කලාපය

ජන හීන ප්‍රදේශ වලට උදාහරණ ලෙස

- මධ්‍යම ආසියාව
- මොංගෝලියාව
- උතුරු දිග තැනිබිම් ප්‍රදේශ
- ගෝබි කාන්තාර ප්‍රදේශ
- ථාර් කාන්තාර ප්‍රදේශ

## <u>ආසියාවේ ජන ව්‍යාප්තිය</u>



| 2017 වන විට ආසියාවේ ජනාධික රටවල් 10 |
| --- |
| • චීනය මිලියන 1370 |
| • ඉන්දියාව මිලියන 1299 |
| • ඉන්දුනීසියාව මිලියන 255 |
| • පාකිස්ථානය මිලියන 192 |
| • බංග්ලාදේශය මිලියන 159 |
| • ජපානය මිලියන 127 |
| • පිලිපීනය මිලියන 103 |
| • වියට්නාමය මිලියන 92 |
| • ඉරානය මිලියන 79 |
| • තුර්කිය මිලියන 78 |

| 2017 වන විට අඩු ජන සංඛ්‍යාවක් වෙසෙන රටවල් 10 |
| --- |
| • මාලදිවයින් 345,000 |
| • බෲනායි 421,000 |
| • මැකාවෝ 641,000 |
| • භූතානය 760,000 |
| • ටිමෝර් මිලියන 1.24 |
| • බහරේන් මිලියන 1.78 |
| • කටාර් මිලියන 2.11 |
| • ආමේනියා මිලියන 3 |
| • මොන්ගෝලියාව මිලියන 3.02 |
| • ජෝජියාව මිලියන 3.73 |

මූලාශ්‍රය : *worldpopulationreview.com/continents/asia-population - 2017.02.01*

## ආර්ථික ක්‍රියාකාරකම්

**අභ්‍යාසය**

- ❖ **ලෝක සිතියමක පකිස්ථානය, ජපානය සහ ඩුබායි ලකුණු කර නම්කරන්න.**
- ❖ **පෙළ පොත කියවා පහත ගැටලු වලට පිළිතුරු සපයන්න.**

1. පකිස්ථානයේ ආර්ථිකයේ ප්‍රධාන අංශය කුමක්ද?
2. එරට බහුලවම වගා කරන බෝගය කුමක්ද?
3. පකිස්ථානයේ නිපදවන කෘෂි ද්‍රව්‍ය මොනවාද?
4. පකිස්ථානයේ ප්‍රධාන වගා කන්න දෙක මොනවාද?
5. එම කන්න දෙක තුළ වගා කරන බෝග වර්ග වෙන වෙනම දක්වන්න.
6. ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදයෙන් ජපානය හිමි කරගෙන ඇති ස්ථානය කුමක්ද?
7. ආසියාවේ ප්‍රධාන කාර්මික රට කුමක්ද?
8. ජපානයේ නිෂ්පාදන කර්මාන්ත මොනවාද?
9. ජපන් මෝටර් රථ වල ඇති විශේෂ ලක්ෂණ මොනවාද?
10. ජපානයේ ඉලෙක්ට්‍රොනික් හා විදුලි උපකරණ නිෂ්පාදන අතින් ප්‍රසිද්ධියට පත් සමාගම් මොනවාද?
11. එක්සත් අරාබි එමීර් රාජ්‍යය සමන්විත වන රාජ්‍යයන් ගණන කීයද?
12. ඩුබායි රාජ්‍යයේ විශාලත්වය කොපමණද?
13. එහි ජන ඝනත්වය කොපමණද?
14. ඩුබායි ආර්ථිකයේ ප්‍රධාන නිෂ්පාදන මොනවාද?
15. ඩුබායි රට විසින් පවත්වාගෙන යනු ලබන සේවා කර්මාන්ත මොනවාද?